# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2456/72 - 2025 ඔක්තෝබර් මස 03 වැනි සිකුරාදා - 2025.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ රත්නපුර මහා නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන රත්නපුර මහා නගර සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ රත්නපුර මහා නගර සභාවේ අංක 9 ගොඩිගමුව කොට්ඨාසයට තේරී පත් වූ නානිම් ආරච්චිගේ දොන් දර්ශණ චමත් ගුණවර්ධන අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම රත්නපුර මහා නගර සභාවේ අංක 9 ගොඩිගමුව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා නානිම් ආරච්චිගේ දොන් කපිල ගුණවර්ධන නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

රත්නපුර මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරී සුරංග අඹගහතැන්නෙ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් නානිම් ආරච්චිගේ දොන් කපිල ගුණවර්ධන, රත්නපුර මහා නගර සභාවේ අංක 9 ගොඩිගමුව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**සුරංග අඹගහතැන්නෙ,**
තේරීම්භාර නිලධාරී,
රත්නපුර මහා නගර සභාව.

2025 ඔක්තෝබර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 10 - 0053

1A - G 45509 — 09 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*